# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2321/66 - 2023 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මිනුවන්ගොඩ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මිනුවන්ගොඩ නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මිනුවන්ගොඩ නගර සභාවේ අංක 05 - මිනුවන්ගොඩ නැගෙනහිර 1 කොට්ඨාසයට තේරී පත්වූ රාජසේකර වඩුගේ නාලක රාජසේකර අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මිනුවන්ගොඩ නගර සභාවේ අංක 05- මිනුවන්ගොඩ නැගෙනහිර 1 කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වාසල මුදලිගේ ලසන්ත විමලවීර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මිනුවන්ගොඩ නගර සභාවේ තේරීම්භාර නිලධාරි කරුණාසිංහ ජයරත්නගේ සම්පත් මාධව වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් වාසල මුදලිගේ ලසන්ත විමලවීර, මිනුවන්ගොඩ නගර සභාවේ අංක 05 - මිනුවන්ගොඩ නැගෙනහිර 1 කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ.ජේ.එස්. මාධව,**
තේරීම්භාර නිලධාරි,
මිනුවන්ගොඩ නගර සභාව.

2023 මාර්තු මස 02 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

EOG 03-0016